**මොරවැව ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මොරවැව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2019,2020,2021 වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලැබුණු රු.323,620ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම දෝෂයන් 2023 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේදී ස්ථාපනය කරන ලද ආරක්ෂිත කැමරා පද්ධතිය වෙනුවෙන් නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.300,000 ක මුදල ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයේ සිදු කළ කොන්ත්‍රාත් 03 ක් සහ ස්ථාවර වත්කම් මිලට ගැනීම් 05 ක් වෙනුවෙන් ලද රු.2,570,368 ක මුදල වර්ෂයේ ආදායමක් ලෙසත්, කොන්ත්‍රාත්කරුවන්ට හා සැපයුම්කරුවන්ට ගෙවූ මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ජල ව්‍යාපෘති 02 කට ආදාළව පාරිභෝගිකයන් 265 කින් අයවිය යුතු රු.567,572 ක මුදල හිඟ ආදායමක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණ රු.14,000,000 ක් වටිනා ජල බවුසරය ගිණුම් ගතකර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.50,465 ක් වූ ස්ථාවර තැන්පතු පොළිය ගිණුම් ගතකර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර 2020, 2021 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.13,800 ක් හා රු.24,600 ක් විගණන ගාස්තු වශයෙන් වෙන් කිරීමක්ද කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඌ) | එකතුව රු.197,340 ක් වූ පරිත්‍යාග ලෙස ලැබුණු භාණ්ඩවල වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන අවිනිශ්චිත ගිණුමේ රු.7,864,759 ක ශේෂය නිරවුල් කර නොතිබුණි. | 2011 අවසන් ගිණුමේ මෙම ශේෂය මුලින්ම සටහන් වන අතර එතැන් පටන් මේ දක්වා සෑම අවසන් ගිණුමකම සටහන් වී ඇත. ඊට අදාළ තොරතුරු නොමැති වීම නිසා මෙය නිරවුල් කිරීමට නොහැකි වී ඇත. කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.106,558,098 ක් වටිනා ගිණුම් ශේෂ 06ක් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, කාල විශ්ලේෂණ, අත්තිකාරම් ලේඛන සහ තොග ගණනය කිරීම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ලේඛන සකස් කිරීමේ ගැටලු පවතින බව සහ ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඇතුළත් ලේඛන පිළියෙල කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 24 වගන්තිය | සභාව සතු මාර්ග සියල්ල හඳුනාගෙන ඉන්වෙන්ට්‍රිගත කිරීමට හෝ ගැසට් පත්‍රයේ පළ කිරීමටත් කටයුතු කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ඇති අතර යාවත්කාලීන කර නොමැත. නැවත වරක් සියලුම මාර්ග මැනීමේ කටයුතුවල නිරත වන අතර එම කටයුතු අවසන් වූ පසු ගැසට් කිරීමට කටයුතු කරන බව. | පවත්නා සියලු මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 134 වගන්තිය | සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ නිශ්චිතව හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගත් ප්‍රදේශ කිහිපයකට අලුතින් වරිපණම් පැනවීමට අවශ්‍ය පියවර ගන්්නා බව. | ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා ගණන්දීමේ නිලධාරියා විසින් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි ගිණුම් ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 193 වැනි රීතිය | අයවැය හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයන්හි තථ්‍ය වියදම සසඳා අතිරික්තය හා ඌණතාවය පිළිබඳව හේතු දැක්වෙන ප්‍රකාශනයන් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 218 වැනි රීතිය | පිරිවැය රු.60,508,564 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණය කර | පිළිගනිමි. 2023 වර්ෂයේ සිට වාර්ෂිකව සමීක්ෂණය කිරීමට | -එම- |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | කටයුතු කරන බව. | |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 1645 සහ 1646 | (ආ) වාහන 07 ක ධාවන සටහන් සහ මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ සිට මාසිකව වාර්තා ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 280,387 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 109,478 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 5,100 | 2,882 | 3,193 | 469 | 1,330 | 2,421 | 2,041 | 780 |
| බලපත්‍ර ගාස්තු | 250 | 1,115 | 1,128 | - | 250 | 132 | 132 | 13 |
| වෙනත් ආදායම් | - | - | - | - | 5,000 | 3,712 | 3,188 | 523 |
| | 5,350 | 3,997 | 4,321 | 469 | 6,580 | 6,265 | 5,361 | 1,316 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **කුලී**<br>සමාලෝචිත වර්ෂය අවසානයට රු.181,038 ක් වූ කඩකාමර කුලී හිඟව පැවැති අතර ඉන් රු.58,336 ක් | අදාල කුලී කරු විසින් හිඟ මුදල ගෙවීමට එකඟ වී ඇති අතර එසේ නොකළහොත් නීතිමය | ගිවිසුම් අනුව හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පෙර වර්ෂ වෙනුවෙන් අයවිය යුතුව පැවතුණි. | පියවර ගැනීමට කටයුතු කරන බව. | |

(ආ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,776,885 ක් හා මුද්දර ගාස්තු රු.84,500 ක් විය. | විධිමත් ලෙස ඉල්ලීම් කර ඇතත් නියමිත කාලයට මුදල් නිකුත් නොකරන බැවින් හිඟ ආදායමක් ලෙස පවතින අතර ඉදිරියේදී නිවැරදි ලෙස කටයුතු කිරීමට සැලසුම් කරන බව. | හිඟ ආදායම් ගෙන්වා ගැනීමට කටයතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| 2017 වර්ෂයේ දී සභාවේ මූලා ප්‍රකාශන අනුව ලබා දුන් රු.1,826,485 ක අත්තිකාරම් පියවා ගෙන නොතිබුණි. | මෙම අත්තිකාරම් පිළිබඳව කිසිදු තොරතුරක් සොයාගැනීමට නොහැකි බැවින් මෙතෙක් පියවීමට අපහසු වී ඇත. පැරණි ලිපිගොනු පරීක්ෂා කරමින් සිටින අතර මෙම වසර තුළ සුදුසු පියවරක් ගත හැකි බව. | පරීක්ෂණයක් සිදු කර අත්තිකාරම් මුදල පියවා ගත යුතුය. |

**3.2 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| සභාව සතු රු.16,695,000 ක් වටිනා JCB යන්ත්‍රයක් දැනට වසර 05 ක පමණ කාලයක සිට අක්‍රියව පැවතුණි. | මෙම වාහනය අලුත්වැඩියා කිරීමට සුදුසු සැපයුම්කරුවෙකු නොමැති නිසාවෙන් අලුත්වැඩියා කිරීමට නොහැකි වී ඇති අතර අලුත්වැඩියාව සඳහා වැයවිය හැකි අධික මුදල දැරීමට සභාවේ මුදල් ප්‍රතිපාදන නොමැති වීමද ගැටළුවක් වී ඇත බව. | වත්කම් කළමනාකරණය විධිමත් කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත සේවක මණ්ඩලය හා සත්‍ය වශයෙන්ම සිටින සේවක සංඛ්‍යාව සලකා බැලීමේදී තනතුරු 07 පුරප්පාඩු 08 ක් පවතින බව අනාවරණය විය. | අදාල පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉහල නිලධාරීන් වෙත අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇත අතර නව බඳවා ගැනීම් අත්හිටුවා ඇති නිසාවෙන් පුරප්පාඩු පිරවීමට බාධා ඇතිවී තිබේ. මේ වන විට තාවකාලික | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | පදනම මත ආදායම් පරීක්ෂක නිලධාරියෙකු සතියට දින 2 ක් අනුයුක්ත කර ඇති බව. | |
| (ආ) නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ PT/03/2021 ට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 11 දෙනෙකු විසින් ප්‍රමාණවත් පරිදි ඇප තබා නොතිබුණි. | කඩිනමින් අදාල නිලධාරීන් ලවා ඇප තැබීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) වසර ගණනාවකට පෙර නිලධාරීන් 04 දෙනෙකුට ලබාදී තිබූ රු.100,146 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල පුද්ගලයන්ගේ තොරතුරු රැස් කරමින් පවතින අතර එම ණය ශේෂ අයකරගැනීමට කටයුතු කරමින් සිටින බව. | -එම- |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ලේඛනය මත පදනම්ව ක්‍රියාකාරකම්වල නිරතව තිබුණි. | ඉදිරි වර්ෂවල සිට ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට කටයුතු යොදා ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද විධිමත් ආකාරයෙන් වාර්තා පවත්වා නොතිබුණි. | 2023 වර්ෂයේ සිට විධිමත් ආකාරයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන බව. | අභ්‍යන්තර විගණන විධිමත් කළ යුතුය. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|
| අංක DNA/2019(1) දරන චක්‍රලේඛය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු 01 ක් පමණක් එනම් 2022 සැප්තැම්බර් 22 දින පවත්වා තිබුණි. | 2023 වර්ෂයේ සිට අදාල චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.4 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 05 ක සියයට 2.49 සිට සියයට 447.56 දක්වාද වියදම් විෂයයන් 05 ක සියයට 12.12 සිට සියයට 54.71 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයන් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තුගත ආදායම් නොලැබීම නිසා ආදයම් විෂයන් සහ වියදම් විෂයන්වල විචලනයන් ඇති වූ බව. | අයවැය තාත්ත්විකව පිළියෙල කළ යුතුය. |

## 4.6 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරණ තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක හඳුනා ගැනීම පිළිබඳ නිසි අවබෝධයක් සමාලෝචිත වර්ෂය තුළදීද ලබාගෙන නොතිබූ නමුත් තිරසර සංවර්ධන කාර්ය සාධන දර්ශක දෙකක් පමණක් ළඟාකර ගෙන තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සියල්ලම ඉටු කරගැනීමට සැලසුම් සකස් කරමින් සිටින බව. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක අත්පත් කර ගත යුතුය. |